ශීර්ෂය 286 - ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

-----------------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2022දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජූනි 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022දෙසැම්බර් 31 දිනට ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේමූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශනය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේමූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ

නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) ආදායම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් රු.113,025,610 ක් වූ සත්‍ය ආදායම තුළ ගාල්ල දිස්ත්‍රික් කාර්යාලයවිසින් දකුණු පළාත් සභාවට බැරකළ යුතු රු.3,836,750ක් වැරදීමකින් ඇතුළත් කර තිබීම හේතුවෙන් දෙපාර්තමේන්තුවේ සත්‍ය ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | 2023.02.28 දිනැති භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් දිස්ත්‍රික් ලේකම්, ගාල්ල වෙත ආදායමෙන් ආපසු ගෙවීමට අධිකාරී බලය ලබා දී ඇත. එම අධිකාරී බලය අනුව ගාල්ල දිස්ත්‍රික් ලේකම් විසින් මෙම නිවැරදි කිරීම අප්‍රේල් මස සිදු කර ඇත. | ආදායම් ගිණුම්ගත කිරීමේදී දෙපාර්තමේන්තුවට අදාළ ආදායම් පමණක් ගිණුම් ගත කල යුතුය. |

**(ආ) මූලධන වියදම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල භෞතික වත්කම් ඉදිකිරීම හෝ මිලදී ගැනීම හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් යටතේ ඇතුළත් විය යුතු රු.643,772 ක් වූ සේවක පුහුණු වැඩසටහන් වලට අදාළ දීමනා පුද්ගල පඩි නඩි හා මෙහෙයුම් වියදම් යන්නට ඇතුළත් කොට ගිණුම් ගත කර තිබුණි. | ඔබ විසින් පෙන්වා දී අති පරිදි ඉදිරි වර්ෂ වල දී භෞතික වත්කම් ඉදිකිරීම හෝ මිල දී ගැනීම හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් යටතේ ගිණුම් ගත කිරීමට සටහන් කර ගතිමි. | පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |

**(ඇ) තැන්පතු**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මු.රෙ.571 (2) හා (3) ඡේද ප්‍රකාරව ඉකුත් වූ සියලුම තැන්පතු රාජ්‍ය ආදායමට බැර කළ යුතු අතර ii වැනි හා iii වැනි පංති වල ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් වන විට ඒවා රාජ්‍ය ආදායමට බැර කිරීමෙන් පසුව ආපසු ලබා ගැනීම සඳහා කෙරෙන ඉල්ලීම් හැකිතාක් දුරට වලක්වා ගැනීමේ අදහසින් එම තැන්පතු රාජ්‍ය ආදායමට බැර කිරීමට පෙර විමසීම් කර බැලිය යුතු අතර අදාළ විස්තර ලැබෙන තෙක් තැන්පතු ගිණුමකට අවිනිශ්චිතව තබා ගෙන ඇති මුදල් ඉකුත් වූ තැන්පතු වශයෙන් සලකනු ලැබීම සඳහා ඉඩ | 2015 සිට 2020 දක්වා පොදු තැන්පතු 2022/12/31 දිනටහා 2023 වර්ෂයේ මේ දක්වා පොදු තැන්පත් ගිණුම් අංක 6000- 0-0-16-0-20 කොන්ත්‍රාත් තැන්පතුරු.14,719,396 ක් නිරවුල් කර ඇති අතර ඉතිරි වටිනාකම රු.51,484,589 කි. නිරවුල් වී ඇති ආකාරය පහත පරිදි වේ.<br><br>ඉංජිනේරු කාර්යය පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යංශයට රු.63,406,325 ක් දෙපාර්තමේන්තුවේ සිව්වන මහලේ ඉදිකිරීම් කටයුතු සඳහා 2021.05.04 දිනැති අමප/21/06/13/322/006 දරන | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර කල් ඉකුත් වූ තැම්පතු නිරවුල් කළ යුතුය. |

| | | |
|---|---|---|
| නොතබා අවස්ථාචෝචිත පරිදි අදාළ ගිණුමට හෝ රජයේ ආදායමට හෝ බැර කළ යුතු වුවද, 2015 සිට 2020 දක්වා පොදු තැන්පත් ගිණුමෙහි රඳවාගෙන ඇති රු.51,484,589 ක් වටිනා තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි උපදෙස් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අමාත්‍යමණ්ඩලයෙන් අනුමැතිය ලැබී ඇත. ඒ අනුව මේ දක්වා රු.13,448,677 ක මුදලක් වවුචර ඉදිරිපත් නොවීම මත පොදු තැන්පත් ගිණුමේ රඳවා ඇත. පොදු තැන්පත් ගිණුම් අංක 6000-0-0-2-0-68 ටෙන්ඩර් තැන්පතුවේ ඉතිරි වටිනාකම රු. 105,000කි. කොන්ත්‍රාත් කරුවන් කීහිපවරක් දැනුවත් කර ඇති අතර මේ වසර අවසාන වන විට ගෙවීම් සඳහා වවුචර් ඉදිරිපත් නොවුනහොත් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීම.තාවකාලික රැඳවුම් තැන්පතු රු. 98,144 නිරවුල් කර ඇත. | |

**(ඇ) මූල්‍ය නොවන වත්කම්**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයෙහි මිහිකත මැදුර ගොඩනැගිල්ලේ සිව්වන මහළ ඉදි කිරීම සඳහා මෙම වාර්තාවේ දිනය වන විට වැය කර ඇති රු.24,114,494 ක් සහ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු.320,750 ක එකතු වටිනාකම වූ රු.24,435,244 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ කෙරීගෙන යන වැඩ ලෙස ජංගම නොවන වත්කම් යටතේ ගිණුම් ගත කර නොතිබුණි. | මිහිකත මැදුර සිව්වන මහළ ඉදි කිරීම් කටයුතු සඳහා වැය කර තිබූ රු.24,114,494 ක පිරිවැය 2023 පෙබරවාරි මස ගිණුම් සාරාංශයෙන් ගිණුම් ගතකර තිබුණි.ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට ගෙවූ රු.320,750 ක වටිනාකම 2023 අප්‍රේල් මස ගෙවීම් සිදු කරන ලද අතර එම වටිනාකම 2023 මැයි මස ගිණුම් සාරාංශයෙන් ගිණුම් ගත කිරීමට කටයුතු කරමි. | සියලුම ගනුදෙනු ගිණුම් ගත කළ යුතු ය. |
| (ii) | දෙපාර්තමේන්තු අන්තර් පළාත් කොමසාරිස් කාර්යාල වලට සහ සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාල වලට අයත් නිල නිවාස,ඉඩම් සහ ගොඩනැගිලි අවසන් වරට තක්සේරු කළ වර්ෂය 2013 බැවින් එම ගොඩනැගිලි වල වර්තමාන තක්සේරු වටිනාකම මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් කරනොතිබුණි. | දෙපාර්තමේන්තුවට අයත් නිල නිවාස, ඉඩම් හා ගොඩනැගිලි 2013,2015 හා 2017 වර්ෂවල තක්සේරු කර ඇතත් ඒවා ප්‍රත්‍යාගණනය කර වටිනාකම ඉදිරිපත් කරන ලෙස 2022.05.09දින තක්සේරු දෙපාර්තමේන්තුවට දන්වා යවා ඇත. එම ප්‍රත්‍යාගණන වටිනාකම් ලද වහාම ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. | සියලුම ස්ථාවර වත්කම්ප්‍රත්‍යාගණනය කළ යුතු ය. |

**(ඉ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව සතු නිල නිවාස සහ සංචාරක බංගලා සඳහා විධිමත් හා යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනයක් 2023 මැයි වන විටද පවත්වා නොතිබුණි. | යාවත්කාලීන කරන ලද විධිමත් ලේඛනයක් මෙම දෙපාර්තමේන්තුව සතුව නොතිබූ බැවින් මාගේඅංක LCGD/AD/8/තක්සේරුකිරීම/2022 හා2023/03/31දිනැති ලිපියෙන් අන්තර් පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාල 06 හා සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාල 02 වෙතට මෙම | විධිමත් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන |

| | | |
|---|---|---|
| | දෙපාර්තමේන්තුව සතු නිල නිවාස සහ සංචාරක බංගලා,ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ තොරතුරු ආකෘතියක් මගින් ගෙන්වා ගෙන ඇති අතර ඒ අනුව විධිමත් ලේඛනයක් පිළියෙල කිරිමට කටයුතුකරමින් පවතින බව දන්වමි. | යා යුතුය. . |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට අන්තර් පළාත් ගොවි ජනපද වල බදුකරුවන්ගෙන් අය විය යුතු හිඟ ඉඩම් බදු ආදායම වූ රු.98,465,851 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. හිඟ ආදායමෙන් සියයට 47 ක් හෙවත් රු.46,349,919 ක් වසර 3 කට වැඩි කාලයක සිට හිඟව පවතින අතර සමාලෝචිත වර්ෂයේදී හිඟ ආදායමෙන් අයකර තිබුණු මුදල රු.16,013,918 ක් විය. | සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉඩම් හා අනෙකුත් බදු කුලි ,හිඟ බදු ප්‍රමාණය රු.98,465,851කි.එම හිඟ බදු ප්‍රමාණයෙන් 2023.03.31 දිනට රු.8,037,239ක බදු ප්‍රමාණයක් අයකර ගැනීමට හැකි වී ඇත.ඉතිරිය අදාළ බදුකරුවන් දැනුවත් කරමින් අන්තර් පළාත් කාර්යාල විසින් හිඟ බදු අයකර ගැනීමේ ක්‍රියාවලිය දැනටමත් කරමින් පවතින බව දන්වමි. | හිඟ බදු ආදායම් නොපමාව අය කර ගත යුතුය. |

### 2.2 වියදම් කළමනාකරණය

වාර්ෂික අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරිම,ප්‍රතිපාදන මාරු කිරීම, පරිපූරක අයවැය ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන ලබා ගැනීම හා උපයෝජනය, ප්‍රතිපාදන උපයෝජනය කිරීම, ඉතිරිවීම් සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන විගණනයේදී පුනරාවර්තන වියදම් සඳහා වෙන් කළ රු.509,370,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 8 ක ප්‍රතිශතයක් එනම් රු.41,757,636 ක්ද, ප්‍රාග්ධන වියදම් සඳහා වෙන් කළ රු.70,600,000 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 69 ක් හෙවත් රු.49,014,496 ක්ද වශයෙන් ශුද්ධ ප්‍රතිපාදනය ඉතිරිව තිබුණි. | 2022 පුනරාවර්තන ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 8 ක් ඉතිරි වී ඇත. ජාතික අයවැය සහ රාජ්‍ය පරිපාලනචක්‍රලේඛ ප්‍රකාරව වියදම් පාලනය කිරීම හේතුවෙන් රජයේ වියදම් අවම කිරීමට කටයුතු කිරීම නිසා බව පෙන්වා දෙමි.<br>එසේම භාණ්ඩ මිල දී ගැනීම් හා සියලුම ප්‍රාග්ධන ස්වභාවයේ වැඩ අත්හිටුවීම ප්‍රාග්ධනවියදම් වල සියයට 69 ප්‍රමාණයක් ඉතිරි වීඇත.ප්‍රාග්ධන ස්වභාවයේ අලුත්වැඩියා කටයුතු අත්හිටුවීම, 286-2-1-2106 වැය විෂය යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල | ප්‍රතිපාදන උපරිම ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු ය. |

සඳහා මිල දී ගැනීමට යෝජිතව තිබූ පරිසනක මිල දී ගැනීමේ ප්‍රසම්පාදන කටයුතු අත්හිටුවීම, යන කටයුතු ඉහත චක්‍රලේඛප්‍රකාරව සිදු කිරීමට වූ බැවින්ඉහත වැය විෂය දෙකෙහි ප්‍රතිපාදන සියයට 86 ක් හා සියයට 77 ක් වශයෙන් ඉතිරි වීඇත.තවද පශ්චාත් උපාධි පාඨමාලා හදාරන නිලධාරීන් ඉල්ලීම් ඉදිරිපත් නොවීම හේතුවෙන් සියයට 65ක ප්‍රතිපාදනඉතිරිව ඇත.

**2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **වටිනාකම** <br> **රු.** | **අනුකූල නොවීම** | | |
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | | | |
| (i) | xxiv පරිච්ඡේදය 4.2.5ඡේදය (අ) | 420,813 | ආපසු ගෙවා අවසන් කර නැති ණය මුදලකින් අයකර ගැනීමට ඉතිරිව තිබෙන මුදල්ද,රජයට හෝ ලෝහෝර් ආර්යා අරමුදලට හෝ ගෙවීමට තිබෙන වෙනත් මුදල්ද විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ නිලධාරියාගේ පරිවර්තිත විශ්‍රාම වැටුපෙන් හෝ පාරිතෝෂිත මුදල් වලින් හෝ අයකර ගත යුතු වූවත්, විශ්‍රාම ලබා ඇති නිලධාරියෙකුගේ වර්ෂ 5 ට වැඩි රු.19,940 ක් ද, මාස 3-12 දක්වා පවතින රු.264,302 ක්ද, මාස 1 -3 අතර පවතින රු.136,571 ක අය විය යුතු ශේෂයන් පවතින බව නිරීක්ෂණය විය. | විශ්‍රාම ගිය නිලධාරින්ගේ ණය ශේෂ විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය මඟින් අය කර ගැනිමට නියමිතය.ජී.ජී. මාටින්ගෙන් අයවිය යුතු රු.19,940 ක් භාර්යාවට වැන්දඹු විශ්‍රාම වැටුප් සකස් කිරීමට ක්‍රියා කරමින් පවතී. 2023.03.22 දින මහනුවර ගඟවට කෝරළේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය වෙත නැවත ලිපියක් යොමු කරන ලදී. ඩී.ඒ.ජී.ධර්මසිරිගෙන් රු.148,732.00ක්ද එම්.කේ.සිරිවර්ධන(ජනනිල) රු.115,570ක්ද ඩබ්.ඒ.සෙනෙවිරත්න(ජන නිල) රු.1,544 ක් හා පී.ඉලංගසිංහරු.23,682, කේ.එම්.එස්.කුමාරසිංහරු.111,345 විශ්‍රාම වැටුප් පාරිතෝෂිතයෙන් අය කර ගැනිමට නියමිතය. | ආයතන සංග්‍රහයේඋ පදෙස් ප්‍රකාරව අයකර ගැනීම කළ යුතු ය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ii) | xxiv පරිච්ඡේදයේ 4.5 සහ 4.6වගන්තිය | 380,076 | (i) සේවය අතහැර ගොස් ඇති නිලධාරියෙකුගෙන් මාස 1 ත් 12 අතර අයවිය යුතු රු.199,354 ක ණය ශේෂයක් සහ මිය ගිය නිලධාරියෙකුගෙන් අය විය යුතු රු.180,722 ක් සම්බන්ධයෙන් ප්‍රධාන ණයකරුගෙන් අයකර ගත නොහැකි අවස්ථාවලදී අනුගමනය කළයුතු යැයි නියම කොට ඇති ක්‍රියාමාර්ගය ඇපකරු සම්බන්ධයෙන් අනුගමනය කොට එම මුදල් ඇපකරුගෙන් අයකර ගතයුතු අතරප්‍රධාන ණයකරු මියගොස් ඇත්නම් ඔහුගේ උරුමක්කාරයන්ගෙන්ද අයකර ගත නොහැකි නම් නීතිපති උපදෙස් ලබා ගත යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මෙම නිලධාරියා සේවය අතහැර යාමේ නිවේදනය 2022.08.18 දින නිකුත් කර ඇත. හිඟණය ශේෂය රු.199,354.00කි.නිලධාරියාගේ පෞද්ගලික ලිපිනයට 2023.03.21 දින දන්වා යවා ඇත. ත්‍රිකුණාමලය නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් කාර්යාලයට අනුයුක්තව සේවය කළ මෙම නිලධාරියා 2022.11.13 දින මිය ගොස් ඇත. 2022 නොවැම්බර් මස වැටුපෙන් ආපදා ණය වාරිකය හා සම්පූර්ණ උත්සව අත්තිකාරම් වාරික අය කර ඇත. 2022 දෙසැම්බර්,2023ජනවාරි,පෙබරවා රි යන මාස වල ඔහුගේ පියා විසින් අදාළ ණය වාරික ගෙවා ඇතත් ණය ශේෂය රු. 180,722කි. සේවා කාලය ප්‍රමාණවත් නොවීම මත මරණ පාරිතෝෂිතයක් හිමි නොවන බැවින් ඇපකරුවන්ගෙන් ණය අය කර ගැනීමට අදාළ ක්‍රියාමාර්ග ගනිමින් පවති. | ආයතන සංග්‍රහයේඋ පදෙස් ප්‍රකාරවකට යුතු කළ යුතු ය. |
| **(ආ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | | |
| | මු.රෙ. 109(1) | 5,283,762 | අයභාර, රක්ෂණ, ඇප යනාදිය වැනි සියලු මාර්ග වලින් අය කර ගත යුතු මුදල් ප්‍රමාණයන් නිර්ණය කිරීමද, ඇතුළුව සියලුම ප්‍රාරම්භක කටයුතු අවසන් කරනු ලැබීමෙන් පසු හානියෙන් අය කර ගත යුතු උපරිම වටිනාකම හා අය කර ගැනීමට තීරණය කරන මුදලක් අතර යම් වෙනසක් ඇතොත් ඒ වෙනස පොතෙන් අස්කර දැමීමට, දෙපාර්තමේන්තුවට බලය හිමි වුවද, එකතුව රු.5,283,762 ක් වූ අවස්ථා 08 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. | දෙපාර්තමේන්තුව සතු යම් රථයකට අනතුරක් සිදු වූ අවස්ථාවේ දළ හෝ තක්සේරු පිරිවැය ,පසු ප්‍රතිසම්පාදන පිරිවැය හෝ අලුත්වැඩියා කිරීමේ සැබෑ පිරිවැයට වඩා වැඩිවන අවස්ථාවන්හිදී එහි වෙනස ගිණුම් වල කපානොහළ ශේෂයක් සේ පෙන්වන අතර, ඒ අනුව මෙහි සඳහන් කරන ශේෂය හානි පාඩු ගිණුම් වලින් කපා හැරීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2019 දෙසැම්බර් 17 දිනැති අංක 08/2019 දරන භාණ්ඩාගාර ලේකම්ගේ චක්‍රලේඛය | සියලුම රාජ්‍ය ආයතන විසින් විද්‍යුත් ප්‍රසම්පාදනය සඳහා 2020 ජනවාරි 31 දිනට පෙර ලියාපදිංචි විය යුතු වුවත්,මෙම දෙපාර්තමේන්තුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අදාළ ලියාපදිංචිය ලබාගෙන නොතිබුණි. | විද්‍යුත් ප්‍රසම්පාදනය සඳහා අප දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය ක්‍රියා විරහිතව පැවති බැවින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා ලියාපදිංචිය ලබා ගෙන නොතිබුණි. මෙම වසරේදී අදාළ ලියාපදිංචිය ලබා ගැනීමට කටයුතු කරමි. | චක්‍රලේඛළ පදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ඈ) | **රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ** | | | |
| | 2018 ජනවාරි 24 දිනැති 05/2018 (1) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 දරන චක්‍රලේඛය | දෙපාර්තමේන්තුව විසින් පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙල කර එය මහජනයාට විවෘත වන පරිදි ප්‍රදර්ශනය කිරීමට කටයුතු කර නොතිබුණි. | දෙපාර්තමේන්තුව සඳහා පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් පසුගිය කාල වකවානුව තුළ පැවති තත්ත්වය මත එය සැකසීමේ යම් ප්‍රමාදයක් සිදු වූ අතර, 2024 වර්ෂය ආරම්භ කිරීමට පෙර ඊට අදාළ කටයුතු අවසන් කිරීමේ හැකියාව ඇති බව කාරුණිකව දන්වා සිටිමි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රජයේ ඉඩම් ආඥා පනත යටතේ බදු පදනම මත ඉඩම් ලබා දීමේ අරමුණට සාපේක්ෂව බදුකර සකස් කිරීමේ ඉලක්කගත ප්‍රමාණය 1500 ක් වුවද, සත්‍ය ප්‍රමාණය 475 ක් හෙවත් සියයට 32 ක ප්‍රතිශතයක පැවතුණි. | බදුකර සකස් කිරීමේ දී මැනුම් සහ තක්සේරු වාර්තා ලබා ගැනීමේදි ඇතිවන ප්‍රමාදය හා තක්සේරුවෙන් පසුව බදුකරය සැකසීමට හිඟබදු එක් වාරිකයක් හෝ ගෙවිය යුතු බැවින් එම සිදුවන ප්‍රමාදයන් හේතුවෙන් බදුකර සකස් කිරීමේ ඉලක්කගත ප්‍රමාණය 2022 වර්ෂයේදී අපේක්ෂා කළ පරිදි සිදු කිරීමට නොහැකි විය. | සැලසුම් කළ ඉලක්ක කරා සාර්ථකව ළඟා වීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | රටතුළ පැවති අර්බුදකාරී තත්ත්වය,නිලධාරීන් සේවයට වාර්තා කිරීම සීමා කිරීම හේතුවෙන් අපේක්ෂිත ඉලක්කය කරා ලගා වීමට නොහැකි විය. | |
| (ආ) | දෙපාර්තමේන්තුවේ ක්‍රියාත්මක සැලැස්මට අනුව රජයේ ඉඩම් තොරතුරු කළමණාකරණ පද්ධතියට ඉඩම් කැබලි 100,000 ක් ඇතුළත් කිරීමට සැලසුම් කර එම පද්ධතියට ඇතුළත් කළ කැබලි ගණන 24,500 ක් පමණ විය. එය සියයට 24 ක ප්‍රතිශතයක් ගෙන තිබුණි | 2022 ශ්‍රී ලංකාව තුළ පැවති ආර්ථිකමය හා දේශපාලන අර්බුදය, ඉන්ධන හිඟය හා සාමය කඩවීම් යනාදී අර්බුදකාරී තත්ත්වය ආදිය නිසා ක්ෂේත්‍රය පරික්ෂා කිරීමට නොහැකි වීම.එසේම e-Slims පද්ධතියට අපේක්ෂිත ඉලක්කගත ප්‍රමාණයට ඉඩම් කැබලි සංඛ්‍යාවක් ඇතුළත් කිරීමට නොහැකි විම. විශේෂයෙන්ම ප්‍රදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ක්ෂේත්‍ර රාජකාරියෙහි නිරතවන නිලධාරින්ට එම රාජකාරියෙහි නිරත වෙමින් ඉඩමට ගොස් ඉඩම් හදුනා ගැනීම් සිදු කිරීමට පැවති ඉන්ධන අර්බුද හමුවේ නොහැකි වීම මූලිකවම මෙම ඉඩම් තොරතුරු පද්ධතියට ඇතුලත් කිරීමේ ඉලක්කය සපුරා ගැනීමට නොහැකි වීමට හේතුවයි. | සැලසුම් කරා සාර්ථකව ළඟා වීමට කටයුතු කළ යුතු ය. |
| (ඇ) | ඉඩම් සංවර්ධන අඥා පනත යටතේ රාජ්‍ය ඉඩම් තොරතුරු හා කළමණාකරණ පද්ධතිය ඔස්සේ බලපත්‍ර සකස් කිරීමේ ඉලක්කය 5000 ක් වුවද, සත්‍ය වශයෙන් සකස් කළ බලපත්‍ර සංඛ්‍යාව 517 ක් හෙවත් සියයට 10 ක ප්‍රතිශතයක් ගෙන තිබුණි. | බලපත්‍ර නිකුත් කිරීම ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් සිදුවේ.2022 වර්ෂයේ රට තුළ පැවති ආර්ථිකමය හා දේශපාලන අර්බුදය,ඉන්ධන හිඟය හා සාමය කඩවීම් යනාදී අර්බුදකාරී තත්ත්වය ආදිය නිසා ක්ෂේත්‍රය පරික්ෂා කිරීම් සඳහා ඉඩම් නිලධාරින්ට යොමු වීමට නොහැකි වීම මත e-Slims පද්ධතියට අපේක්ෂිත ඉලක්කගත ප්‍රමාණයට ඉඩම් කච්චේරි පවත්වා බලපත්‍ර නිකුත් කිරීමට නොහැකි විය. විශේෂයෙන්ම ප්‍රදේශීය ලේකම් කාර්යාල වල සේවයේ නියුතු ඉඩම් නිලධාරින් සහ අනෙකුත් නිලධාරීන් වෙනත් රාජකාරි සඳහා යොදා ගැනීමත් නිසා ඉඩම් රාජකාරි කටයුතු ප්‍රමුඛ ලෙස සිදු කිරීමට නොහැකිවීම් මත පද්ධතිය හරහා සකස් කළ බලපත්‍ර සංඛ්‍යාවෙහි අඩුවක් දක්නට ලැබුණි. | සැලසුම් කළ ඉලක්ක කරා සාර්ථකව ළඟා වීමට කටයුතු කළ යුතු ය. |
| (ඈ) | ඉඩම් ලේඛන ඇසුරින් තොරතුරු දත්ත පද්ධතියට ඇතුළත් කිරීම පිළිබඳ විග්‍රහත්මකව සමාලෝචනය කිරීමේදී 2020 වර්ෂය තුළ 63,955 ක්ද, 2021 වර්ෂයේ 62,785 ක්ද, 2022 වර්ෂය තුළ එය 24,499 ක් ලෙස ද සඳහන් වන අතර එය 2021 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී 38,286 කින් අඩු වී තිබුණි. | 2022 වර්ෂයේදී සමාජ අස්ථාවරත්වය රට තුළ සියලු අංශ වලට අහිතකර ලෙස බලපෑ එම තත්ත්වය සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉඩම් රාජකාරී කටයුතු වලටද අහිතකර ලෙස බලපෑ හෙයින් පද්ධතිය හරහා සිදු කරනු ලබන ඉඩම් රාජකාරී කටයුතු වලටද එය අහිතකර ලෙස බලපාන ලදි. වි ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සේවයේ නියුතු ඉඩම් නිලධාරීන් වෙනත් කටයුතු වලට අනියුක්ත කිරීම් හේතුවෙන් ඉඩම් රාජකාරි කටයුතුවල යම් අඩපණ වීමක් සිදු විය. එම තත්ත්වය නිසා | සැලසුම්කළ ඉලක්කකරා සාර්ථකව ළඟා වීමට කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | | 2021 වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂයේ ඉඩම් ලේඛණ ඇසුරින් තොරතුරු දත්ත පද්ධතියට ඇතුළත් කිරීමේ ප්‍රගතිය අඩු මට්ටමක පැවතුණි. | |
| (ඉ) | අනු ලේඛන සහිතව ඉඩම් වල ක්ෂේත්‍ර තොරතුරු දත්ත පද්ධතියට ඇතුළත් කිරීමේ ප්‍රගතිය 2020 වර්ෂයේ 90,337 ක්ද, 2021 වර්ෂයේ 15,973 ක්ද, 2022 වර්ෂයේ 14,766 ක්ද විය. එහි ප්‍රගතිය 2020 වර්ෂයට සාපේක්ෂව, 2021 වර්ෂයේදී සියයට 82 කින්ද, 2022 වර්ෂයේදී සියයට 84 කින් ද අඩුවී තිබුණි | 2020 සහ 2021 වර්ෂයේ කොරෝනා වසංගතය ඉඩම් නිලධාරින් හට එම ඉඩම් රාජකාරී කටයුතු කරගෙන යාමට නොහැකි වීම. ඉඩම් නිලධාරීන් වෙනත් රාජකාරී කටයුතු වලට යොමු කිරීම.එසේම 2022 වර්ෂයේ පැවති දේශපාලන හා ආර්ථික අස්ථාවරත්වය හේතු කොටගෙන 2020 වර්ෂයට සාපේක්ෂව 2021 සහ 2022 වර්ෂයන්හි ඉඩම් වල ක්ෂේත්‍ර තොරතුරු දත්ත පද්ධතියට ඇතුලත් කිරීමේප්‍රගතිය අඩු මට්ටමක් පැවතුණි. | සැලසුම් කළ ඉලක්ක කරා සාර්ථකව ළඟා වීමට කටයුතු කළ යුතු ය. |

## 3.2 කාර්ය සාධන ගිවිසුම් අත්සන් නොකිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 ජනවාරි 24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018 හි ඇමුණුම 01 ආකෘතිය පදනම් කර ගනිමින් 2018 වර්ෂයේ පටන් කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීම සිදු කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් එම කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | මේ වන විට කාර්යය සාධන ගිවිසුම් අත්සන් කරමින් පවතී. | සෑම වර්ෂයකම කාර්ය සාධන ගිවිසුම් අත්සන් කළ යුතු ය. |

## 3.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතුව තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බිම් සවිය ව්‍යාපෘතිය යටතේ දෙපාර්තමේන්තුව විසින් ඉඩම් කච්චේරි පැවැත් වීම, බලපත්‍ර නිකුත් කිරීම, දීමනා පත්‍ර නිකුත් කිරීම, ජංගම සේවා පැවැත්වීම, කොට්ඨාශ දින පැවැත්වීම සහ ගැටළු වලට විසඳුම් සෙවීම යන ක්‍රියාකාරකම් සැලසුම් කර තිබුණු අතර ඉඩම් කච්චේරි පැවැත් වීම හැර අනෙක් කාර්යන්හි ප්‍රගතිය සියයට 3 ත් සියයට 39 ත් අතර පහළ පරාසයක පැවතුණි. | ඉඩම් අමාත්‍යාංශයෙන් ලද තොරතුරු අනුව, එහි ප්‍රතිපාදන ප්‍රමාණය සඳහන් කර නොමැති බව දන්වමි. 2018 වර්ෂයේ ඉඩම් අමාත්‍යාංශය මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය යටතේ පැවති අතර එම අමාත්‍යාංශය විසින් 2018.12.11 දිනැති ලිපිය අනුව 2018 වර්ෂය සඳහා රු.16,820,000 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත වෙන් කර ඇත.අදාළ ලිපිවල පිටපත් අමුණා ඇත. භාණ්ඩාගාර මුද්‍රිත සටහන් සහ අනෙකුත් වාර්තා පදනම් කරගෙන සකසන ලද සංශෝධිත වාර්තා අනුව ඉඩම් කොමසාරිස් ජනරාල් | සැලසුම්වලට සාර්ථකව ළඟා වීමට කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | | දෙපාර්තමේන්තුව අනුව වියදම රු. 47,000,000ක් බව දන්වමි. | |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ ඉඩම් කච්චේරි 30 ක් පැවැත්වීමට සැලසුම් කර ඉඩම් කච්චේරි 71 පවත්වා තිබුණි. එය වාර්ෂික ඉලක්කයට වඩා ඉහළ අගයකි. ඒ අනුව පැවැත්විය හැකි ප්‍රශස්ත ඉඩම් කච්චේරි පිළිබඳව අවධානය යොමු නොකර පසුගිය කාල පරිච්ඡේදය තුළ ඉතා පහළ ඉලක්කයක සිට සැලසුම් සකස් කර ඇති බව නිරීක්ෂණය විය. | 2022 වර්ෂය පුරා පැවති අර්බුදකාරී තත්වය හා ඉන්ධන අර්බුදය හේතුවෙන් සැලසුම් කළ ක්ෂේත්‍ර රාජකාරීන් සිදු කිරීමට නොහැකි වී ඇත.එසේම ජනතාව රැස්කරමින් ඉඩම් කච්චේරි පැවැත්වීමට ඇති අපහසුතාවය මත අපේක්ෂිත ඉඩම් කච්චේරි ප්‍රමාණය සැලසුම් ලෙස දක්වා ඇතත් ප්‍රායෝගිකව පැවැත්වීමට අපහසු වී ඇත. | පවතින ධාරිතාවයට සරිලන ලෙස ඉලක්ක ස්ථාපිත කළ යුතු ය. |

### 3.4 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුවේ නිල නිවාස පිළිබඳ ලිපි ගොනු පරීක්ෂා කිරීමේදී දැනට භාවිතා කරන නිල නිවාස 89 ක්ද, භාවිතයට නොගන්නා නමුත් භාවිතා කළ හැකි නිල නිවාස 59 ක්ද, භාවිතයට ගත නොහැකි නිල නිවාස හෝ දැනට ඉඩම පමණක් පවතින අවස්ථා 61 ක්ද, වෙනත් දෙපාර්තමේන්තු වෙත පවරා ඇති නිල නිවාස 17 ක්ද, අනවසර පදිංචිකරුවන් ඇති නිල නිවාස 14 ක්ද, පැවරීම් කටයුතු සිදු කරමින් පවතින නිල නිවාස 08 ක්ද, වශයෙන් නිවාස 248 ක් පැවතුණි.එම නිවසයන් හි ජල පහසුකම් නොමැති වීම, පරිහරණ උපාංග අබලන් වී තිබීම, නිවාස වහල හා බිත්ති අබලන් වී දිරාපත් වී යාම, අනවසර පදිංචි වීම, අවිධිමත් ලෙස නිල නිවාස වලින් ඉවත් නොවීමත් ඒ සඳහා දණ්ඩන කුලිය අය නොකිරීම, නිල නිවාස විධිමත්ව හා ක්‍රමානුකූලව නිල නිවාස අයදුම් කරන නිලධාරීන්ට භාර නොදීම, නිල නිවාස හිමි නැති නිලධාරීන්ට නිල නිවාස ලබා දිම වැනි කරුණු නිරීක්ෂණය විය. එම නිවාස සම්බන්ධයෙන් , 2022 අප්‍රේල් | • අනවසරපදිංචිකරුවන්ට නීතිමය ක්‍රියාමාර්ගගැනීමටඅවශ්‍ය කටයුතුකඩිනමින්සිදුකරගන්නාලෙසටත්<br>• අවශ්‍යතාවය පරිදි වෙනත් රාජ්‍ය ආයතනයකට හෝ බාහිර පාර්ශවයන්ට නීත්‍යානුකූල ක්‍රමවේදයන් අනුගමනය කරමින් ඒවා පැවරීමට පියවර ගන්නා ලෙසටත්<br>• ගිවිසුම් කාලය සම්පූර්ණ වු පසුවත් රැඳී සිටින නිලධාරීන්ට/පුද්ගලයින්ට එරෙහිව සුදුසු නීතිමය ක්‍රියාමාර්ග ගන්නා ලෙසටත්<br>• අන්තර් පලාත් කාර්යාලයට අයත් දැනට භාවිතයට නොගන්නාමුත් භාවිතයට ගත හැකි නිල නිවාස,ඉඩම් හා ගොඩනැගිලි ඵලදායීව ප්‍රයෝජනයට ගැනීම සඳහා අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා ලෙසටත්<br>• අලුත්වැඩියා කළයුතු අත්‍යාවශ්‍ය භාවිතයට ගත නොහැකි නිල නිවාස,ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් ඇස්තමේන්තු සකස් කර එවීමට කටයුතු කරන ලෙසටත්<br>• නිල නිවාස සම්බන්ධයෙන් අයකරනු ලබන නිල නිවාසයන්හි කුලිය පිළිබඳව වාර්තාවක් සකස් කර මාසිකව යොමු කරන ලෙසටත් දන්වා ඇත. | නිල නිවාස වල අයිතිය හා ආරක්ෂාව තහවුරු කර ගැනීමට, විධිමත් වත්කම් ලේඛනයක් පවත්වා ගැනීමට,නිල නිවාස ලබා දීම,කුලී අයකිරීම පිළිබඳ විධිමත් ක්‍රියා පිළිවෙලක් හඳුන්වාදීම සිදු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | 04 දිනැති භාණ්ඩාගාර ලේකම්ගේ වත්කම් කළමණාකරණ චක්රලේඛ අංක 05/2022 අනුව, රජයේ දේපළ අස්ථානගත වීම සහ අවභාවිතය වැලැක්වීමට මෙන් ම රජයේ දේපළ උපරිම ඵලදායිතාවයෙන් ප්‍රයෝජනයට ගැනීම තහවුරු කිරීම සඳහා රජය සතු සියලුම මූල්‍ය නොවන වත්කම් නිසි පරිදි ලේඛන ගත කර පවත්වා ගැනීම සහ වාර්තා කිරීම සියලුම ආයතන ප්‍රධානීන්ගේ අනිවාර්යය කාර්යයක් වන අතර, සියලුම රාජ්‍ය ආයතන ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අධීක්ෂණය යටතට ගැනෙන අයතනයන්හි සියලුම මූල්‍ය නොවන වත්කම්, වත්කම් කළමණාකරණ චක්‍රලේඛ විධිවිධාන අනුව යාවත්කාලීන කර නියමිත දිනට කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කළ යුතු වුවත් දෙපාර්තමේන්තුව සතු නිල නිවාස සහ සංචාරක බංගලා පිළිබඳ විස්තර යාවත්කාලීන කර විධිමත්ව ලේඛනගත කර නොතිබුණි. | • එසේම පවත්නා ගොඩනැගිලි නඩත්තු කිරීම සහ අලුත්වැඩියා කිරීම ප්‍රමුඛතාවයන් අනුව ඉදිරියේදී කිරීමට සටහන් කරගත් බවත් දන්වන අතර නිල නිවාස,ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් වන තොරතුරු නිසි පරිදි යාවත්කාලීන කර මාස 03කට වරක් සියලුම අන්තර් පලාත් ඉඩම් කොමසාරිස් කාර්යාල හා සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාල වෙතින් ලබා ගැනීමටත් කටයුතු කරන බවත් දන්වමි. | |
| (ආ) | රජයේ නිල නිවාස තම ආයතනය සතු වත්කම් බවත්, එම වත්කම් නිෂ්කාර්යව හෝ අවභාවිතයටනොයොදා චක්‍රලේඛ හා ආයතන සංග්‍රහයේ නීති රීති වලට අනුකූලව කාර්යක්ෂමව හා ඵලදායී ලෙස භාවිතා කිරීම ආයතනය සතු වගකීමක් වුවද, එසේ සිදු කර නොතිබුණි. | පවත්නා ගොඩනැගිලි නඩත්තු කිරීම සහ අලුත්වැඩියා කිරීම ප්‍රමුඛතාවයන් අනුව ඉදිරියේදී කිරීමට සටහන් කරගත් බවත් දන්වන අතර නිල නිවාස,ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් වන තොරතුරු නිසි පරිදි යාවත්කාලීන කර මාස 03කට වරක් සියලුම අන්තර් පලාත් ඉඩම් කොමසාරිස් කාර්යාල හා සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාල වෙතින් ලබා ගැනීමටත් කටයුතු කරන බවත් දන්වමි. | නිල නිවාස වලින් උපරිම ප්‍රයෝජන ගත යුතු ය. |

**3.5 පාඩු හා හානි**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අංක KK - 6496 වාහනය 2018 ජූලි 06 දින අනතුර සම්බන්ධ හානියේ වටිනාකම රු.884,621 ක් විය. මු.රෙ.104(4) ප්‍රකාරව පරීක්ෂණ පවත්වා රියදුරු වගකිව යුතු බව සඳහන් කර ඇතත් රියදුරු විසින් සිදු කර තිබූඅභියාචනයක් මත නැවත මු.රෙ.104(4) පරීක්ෂණ කමිටුවක් පත් කර ඇතත් 2023 | මු.රෙ.104 අවසන් පරීක්ෂණ මණ්ඩලය සඳහා අංක 3/2/1 හා 2023.05.16 දින ලිපියට අනුව සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ සභාපතිත්වයෙන් යුතුව සාමාජිකයන් පත්කර මේ වන විට පරීක්ෂණය සිදු කරමින් පවතින අතර එම මණ්ඩලයේ තීරණය අනුව | කඩිනමින් අලාභය වගකිව යුතු අයගෙන් අය කර ගත යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | මැයි විගණිත දින දක්වාම අලාභය අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදීඅනතුරෙන් සිදු වූ හානි පාඩු අයකර ගැනීමට නියමිතය | |
| (ආ) | අංක NA - 9290 දරන වාහනය 2018 ඔක්තෝබර් 31 දින අනතුරට පත් වී එහි හානියේ වටිනාකම රු.4,036,061 ක් වුවත් රක්ෂණ සමාගමෙන් රු.3,389,561 ක් ප්‍රතිපූර්ණය කරගෙන ඇතත් දෙපාර්තමේන්තුව විසින් දරන ලද මුදල රු.646,500 ක් වී තිබුණි.අදාළ හිග මුදල මු.රෙ 109 ප්‍රකාරව වගකිව යුත්තන්ගෙන් අය කර ගැනීමට හෝ ගිණුම් වලින් ඉවත් කිරීමක් හෝ සිදුකර නොතිබුණි. | අනතුර සම්බන්ධයෙන් රියදුරුට චෝදනා ගොනුකර රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත යොමුකර ඇත.එම අමත්‍යාංශය ලබා දෙන තීරණය අනුව මුලු හානියෙන් රක්ෂණ සමාගම ප්‍රතිපූර්ණය කල වටිනාකමෙන් පසු ඉතිරි වූ මුදල වන රු.646,500 ක මුදල අයකර ගැනීම කටයුතු කිරීමට නියමිතය. | සිදුව ඇති අලාභය වගකිව යුතු පාර්ශවයන්ගෙන් නොපමාව අය කර ගත යුතු ය. |
| (ඇ) | අංක PF - 6074 දරන වාහනය 2022 දෙසැම්බර් 21 දින අනතුර සම්බන්ධ හානියේ වටිනාකම රු.931,185 කි. මුදල් රෙගුලාසි 109 යටතේ අලාභය කපා හැරීමට යෝජනා වී තිබුණද, මේ පිළිබඳව ගිණුම් වල හෙළිදරව් කර නොතිබුණි. | මෙම අනතුර සම්බන්ධයෙන් අලුත්වැඩියාව සිදුකරමින් පවතින අතර නියෝජිත ආයතනය විසින් ඉදිරිපත් කර ඇති ඇස්තමේන්තුවේ සඳහන් මුදල රක්ෂණ සමාගම විසින් සම්පූර්ණයෙන් ප්‍රතිපූර්ණය නොකරන බැවින් යාන්ත්‍රික ඉංජිනේරු නිර්දේශය පරිදි ලියාපදිංචි වෙනත් ආයතනයක් මගින් සිදුකිරීමට අනුමත කර ඇත. | මෙම හානිය ගිණුම්වල හෙළිදරව් කළ යුතු ය. |
| (ඈ) | අංක PD - 6509 දරන වාහනය 2021 දෙසැම්බර් 23 දින අනතුරට පත් වී එම හානියේ වටිනාකම රු.2,161,650 ක් වුවත් ඒ සඳහා 2023 මැයි වන විටද රක්ෂණ වන්දි ලබා ගැනීම හෝ මුදල් රෙගුලාසි 109 ප්‍රකාරව මේ සඳහා වගකිව යුතු අයගෙන් වන්දි ලබා ගැනිම හෝ සිදු කර නොතිබුණි. | මෙම වාහනය අනතුරට ලක් වී මාස 10ක් යනතෙක් නියෝජිත ආයතනය විසින් අලුත්වැඩියා කිරීම ආරම්භ කර නොතිබු හෙයින් වෙනත් ලියාපදිංචි ආයතනයක් වෙත අලුත්වැඩියාව සඳහා යොමු කරන ලදී. මේ වන විට අලුත්වැඩියා කටයුතු සිදුකරමින් පවතින අතර අලුත්වැඩියාවෙන් පසු වැය වන මුදල රක්ෂණ සමාගම විසින් ප්‍රතිපූර්ණය සඳහා කටයුතු කරන අතර ප්‍රතිපූර්ණයෙන් පසු ඉතිරි මුදලක් වේනම් අධිකරණයේ නඩු පවරා අයකර ගැනීමට නියමිතය. | මුදල් රෙගුලාසි උපදෙස් ප්‍රකාරවකටයුතු කර නොපමාව අලාභය අයකරගත යුතුය. |

### 3.6 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරික්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තු වාර්ෂික වාර්තාප්‍රකාරවශ්‍රී ලංකාවේ මුළු භූමි ප්‍රමාණයෙන් සියයට 20 ක් පමණ වන රජයේ ඉඩම් සම්බන්ධ සෘජු වගකීමක් දෙපාර්තමේන්තුව වෙත | රජයේ ඉඩම් පිළිබඳ සංගණනයක් සිදුකර ඉඩම් තොරතුරු පද්ධතියක් සකස් කිරීම සඳහා 2020 වර්ෂයේ අග භාගයේ ආරම්භ කර ඇත.ඒ අනුව ,එහි මූලික කාර්යය ලෙස තොරතුරු රැස්කිරීමේ පත්‍රිකා මුද්‍රණය කර සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත යොමුකර ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් තොරතුරු එකතු කරමින් පවතී.මෙම වැඩසටහන 2022 ඔක්තෝම්බර් 30 දිනෙන් අවසන් වීමට තිබුණ ද, රටේ පැවති තත්ත්වය | ඉඩම් ලේඛනයක් හෝ රජයේ ඉඩම් පිළිබඳ දත්ත පද්ධතියක් සකස් කළ |

| | | | |
|---|---|---|---|
| | පැවරෙන බව හඳුනා ගෙන තිබුණද 1931 වර්ෂයේ දෙපාර්තමේන්තුව පිහිට වූ දින සිට සිදු කරන ලද ඉඩම් බැහැර කිරීම් ඇතුළත් කරමින් සකස් කරනලදඉඩම් ලේඛනයක්පවත්වා නොතිබුණි. | සැලකිල්ලටගෙන එම කාල සීමාව 2023 සැප්තැම්බර් 30 දින දක්වා දීර්ඝ කර ඇත.එමෙන්ම රජයේ ඉඩම් බැහැර කිරීම සම්බන්ධ කටයුතු සඳහා දෙපාර්තමේන්තුව සතු E-SLIMS පද්ධතිය සමග මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ මැනුම් දත්ත පද්ධතිය ඒකාබද්ධ කොට බැහැර කළ හැකි සහ බැහැර කරන ලද ඉඩම් විස්තර ඇතුලත් ඉඩම් දත්ත බැංකුවක් ස්ථාපනය කිරීම සඳහා සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය මගින් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් යොමු කර ඇත. | යුතුය. |
| (ආ) | 2008 වර්ෂයේදී රු.12,000,000 කට මිලදී ගත් KH - 5690 දරන වාහනය අපහරණය කළ යුතු වූවත් මෙම වාර්තාවේ දින වන විට ද අපහරණය කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ ධාවන තත්ත්වයේ නොමැති වාහන අලුත්වැඩියාව සම්බන්ධයෙන් තීරණ ගැනීම සඳහා කමිටුවක් පත් කළ අතර KH 5690 අංක දරන වාහනය සම්බන්ධව 2022.09.30 දිනැතිව ලබාදුන් තීරණය අනුව අපහරණයනොකර අලුත්වැඩියා කර භාවිතා කිරීමට,වෙනත් රජයේ ආයතනයක් වෙත පවරාදීමට හෝ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට නිර්දේශ කර ඇත.ඒ අනුව කටයුතු කරමින් පවතී. | සුදුසු පරිදි අපහරණයකළ යුතු ය. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ කාර්ය සාධන වාර්තාව මගින් තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක ලෙස ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බලපත්‍ර නිකුත් කිරීම සහ දීමනා පත්‍ර සකස් කිරීම දක්වා ඇතත් දෙපාර්තමේන්තුව සහ පළාත් සභා මගින් අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමේ ප්‍රගතිය වෙන් කර දක්වා නොතිබීම හේතුවෙන් තිරසර සංවර්ධන අරමුණු ඉටු කර ගැනීමට දෙපාර්තමේන්තුවේ දායකත්වය ඇගයීමට නොහැකි වී තිබුණි. | 2022 කාර්ය සාධන වාර්තාවේ 2.1 හි දැකිවෙන වගුවෙ හි 1.i.ii යටතේ දැක්වෙන ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බලපත්‍ර සකස් කිරීමට අදාළ ඉලක්කයන් හා ප්‍රගතිය, අන්තර් පළාත් සහ පළාත් සභා ලෙස වෙන වෙනම දක්වා ඇත. කෙසේ වෙතත් දීමනාපත්‍ර සඳහා රේඛා චිත්‍ර සහ අනෙකුත් ලේඛන සහිතව නිර්දේශ යොමු කරනු ලබන්නේ ඒ අදාල අන්තර් පළාත් කාර්යාල හෝ පළාත් ඉඩම් කාර්යාල වෙතින් වන අතර, දීමනාපත්‍ර සැකසීම කරනු ලබන්නේ මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය මගිනි. එබැවින් දීමනාපත්‍ර වෙන් කර දැක්වීමේ හැකියාවක් නැත. | බලපත්‍ර නිකුත් කිරීම සහ දීමනා පත්‍ර සකස් කිරීම විධිමත් අධීක්ෂණයක් යටතේ සිදු කර, තිරසර සංවර්ධනඅරමුණු ඉලක්ක කරා ළඟා විය හැකි ලෙසසැලසුම් සකස් කළ යුතුය. |

**5.** **මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

දෙපාර්තමේන්තුවේ අනුමත හා තත්‍ය කාර්යමණ්ඩලය පහත දැක්වේ.

| | **අනුමත සංඛ්‍යාව** | **තත්‍ය සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 53 | 34 | 19 |
| තෘතියික | 38 | 06 | 32 |
| ද්විතීයික | 673 | 473 | 200 |
| ප්‍රාථමික | 140 | 79 | 61 |
| එකතුව | <u>904</u> | <u>590</u> | <u>312</u> |

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 19 ක් ද, තෘතියික කාර්ය මණ්ඩලය 32 ක්ද, ද්විතීයික කාර්ය මණ්ඩලය 200 ක් සහ ප්‍රාථමික අංශය 61 ක් ලෙස පැවති එම පුරප්පාඩු 2023 මැයි මස වන විටද සම්පූර්ණ කර ගෙන නොතිබුණි.<br><br>(ආ) පුරප්පාඩු වී ඇති තනතුරු අතුරින් සහකාර ඉඩම් කොමසාරිස්වරු 11 දෙනෙකුගේ පුරප්පාඩුද, ජනපද නිලධාරීන් 28 දෙනෙකුගේ වැඩ අධිකාරී 20 දෙනෙක්ද, ජනපද නිලධාරී 117 දෙනෙක්ද, කළමණාකරණ නිලධාරී 97 ක්ද, ලේඛන භාරකරු 12 දෙනෙකු සහ මැහුම් සහයක 18 දෙනෙකුගේ පුරප්පාඩු පවතින බව තවදුරටත් නිරීක්ෂණය විය.<br><br>(ඇ) දෙපාර්තමේන්තුව තුළ සංවර්ධන සහකාරවරු 260 දෙනෙකු අනුමත වී තිබුණු අතර, සේවයේ නියුතු සංඛ්‍යාව 303 ක් වූයෙන් සංවර්ධන සහකාරවරු 43 දෙනෙකුගේ අතිරික්තයක් පැවතුණි. | දෙපාර්තමේන්තුව සතු නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් කාර්යාල 06ක් ඉඩම් කොමසාරිස් කාර්යාල බවට පත් කිරීමත් සමඟ ප්‍රාදේශිය කාර්යාලවල ඇතිවූ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 04 ක් ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරින්ගෙන් සම්පූර්ණ කර ඇත. ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු පහෙහි පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය දැනුවත්කර ඇත.තවද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ IIIශ්‍රේණියේ තනතුරු 10 පුරප්පාඩු පිරවීම සඳහාද රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත ඉල්ලීම්කර ඇත.ඒ අනුව උක්ත ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු මෙම දෙපාර්තමේන්තුවේ පරිපාලනය සඳහා අත්‍යාවශ්‍ය බැවින් අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීමට හැකියාවක් නැත.<br>ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු පහෙහි පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය දැනුවත්කර ඇත.<br>මෙහි ජනපද නිලධාරී තනතුරු 117ක් නොව 121 මේ වන විට පුරප්පාඩු වී ඇති අතරම එකී පුරප්පාඩු වනුයේ ජනපද නිලධාරී I,II හා III ශ්‍රේණියේ නිලධාරීන් වන අතර III ශ්‍රේණියේ ජනපද නිලධාරී තනතුර සඳහා අංක 195/10 හා 2016.11.29 දිනැති ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාවේ 7.1 අනුව විවෘත ධාරාව යටතේ සියයට 70ක් ද ,7.2 අනුව සීමිත ධාරාව යටතේ සියයට 30ක් ද බඳවා ගැනීමේ හැකියාවටයටත්ව බඳවා ගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත්කර ඇති නිලධාරී කමිටුව වෙත LCGD/AD/4/4/2021 හා 2023.03.02 දිනැතිව දන්වා යවා ඇත.මෙහි ජනපද නිලධාරීන් පුරප්පාඩු 28ක් පුරප්පාඩු සම්පූර්ණ කළ හැකි වනුයේ ඉහත කී | පුරප්පාඩු පිරවිය යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2018 ජනවාරි 24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 02/2018 අනුව මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාළව මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | නිලධාරීන්ගේ උසස් වීමේ ක්‍රියාපටිපටිය මගින් හෙයින් ජනපද නිලධාරී I,II හා III ශ්‍රේණියේ පුරප්පාඩු සම්පූර්ණ වන තෙක් විශේෂ ශ්‍රේණියේ පුරප්පාඩු සම්පූර්ණ කළ නොහැකි වී ඇත. අනුමත ලේඛන භාරකරු තනතුරු 12ක් නොව එක් තනතුරක් පමණක් ඇති අතර එකී තනතුර යටපත් කරන ලෙස දන්වමින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත දන්වා යවා ඇත.දැනට දෙපාර්තමේන්තුව තුල ලේඛන භාරකරු තනතුරු නාමය භාවිතයට නොගන්නා බැවින් ,එම තනතුරුවල රාජකාරී කටයුතු කළමනාකරණ සේවා නිලධාරී තනතුරු වලට අයත් නිලධාරීන් වෙතින් ඉටු කරගන්නා බව වැඩි දුරටත් දන්වමි.රාජ්‍ය වියදම් කළමනාකරණය සම්බන්ධ ඉදිරිපත් කරන ලද අංක 21/1596/304/134 හා 2021/8/31 දිනැති අමාත්‍යමණ්ඩල පත්‍රිකාවේ තිරණය ප්‍රකාරව නව බදවා ගැනීම් තාවකාලිකව නවත්වා ඇති බැවින් උක්ත පුරප්පාඩු පිරවීමට නොහැකි වී ඇත.තවද ප්‍රාථමික සේවා ගණවල පුරප්පාඩු පිරවීම සඳහා බහුකාර්ය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් කර ඇත.එමෙන්ම 2022.02.25 දිනැතිකළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2020 මගින්සියලු බඳවා ගැනීම් තාවකාලිකව අත්හිටුවන ලෙස දන්වා ඇති බැවින් තවදුරටත් නවක නිලධාරීන් බඳවා ගැනීම් සිදුකිරීමට හැකියාවක් නොමැත.දෙපාර්තමේන්තුව තුළ අනුමත සංවර්ධන සහකාර/නිලධාරී සංඛ්‍යාව 260ක් වුවද 2021 වර්ෂයේ සංවර්ධන නිලධාරීන් ලෙස බදවා ගත් නිලධාරීන් හේතුවෙන් සංවර්ධන සහකාර/නිලධාරී තනතුරු වල අතිරික්තයක් පෙන්වන නමුත් එකී නිලධාරීන් දෙපාර්තමේන්තුව වෙත අනුමත කර දෙන ලෙස දන්වමින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇති අතර එකී අනුමැතිය ලද පසු මෙම අතිරික්තය අහෝසි වී යනු ඇති බව දන්වමි.කළමනාකරණය විසින් අදහස් දක්වා නොමැත. | පුරප්පාඩු පිරවිය යුතු ය. |